# සියලුම ඇගයීම් පරීක්ෂක අයදුම්කරුවන් සඳහා අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

ඉතා වැදගත් :-

- ❖ ඉල්ලා ඇති සියලු තොරතුරු නිවැරදිව සම්පූර්ණයෙන් සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සපයා ඇති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම දීර්ඝ කාලීනව විභාග රාජකාරී තහනමකට හා විනයානුකූලව කටයුතු කිරීමට හේතු වේ.
- ❖ අයදුම්පත්‍රයේ තරු (*) ලකුණින් දක්වා ඇති කොටස් අනිවාර්යයෙන් සම්පූර්ණ කළ යුතු අතර අනෙකුත් කොටස් ද තමන්ට අදාළ වන පරිදි සම්පූර්ණ කළ යුතු ය.

01. අංක 03 (01) 2009 හා 2011.03.01 දිනැති සංශෝධිත චක්‍රලේඛයෙහි උපදෙස් අනුගමනය කළ යුතු ය.

1.1 පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ දැනට සේවයේ නියුතු ගුරුවරුන්ට, පෙර වර්ෂවල ඇගයීම් කටයුතු සඳහා සහභාගී වූ ගුරු උපදේශකවරුන්ට සහ නිලධාරීන්ට මේ සඳහා ඉල්ලුම් කළ හැකි ය.

1. තොරතුරු තාක්ෂණ විෂයය සහිතව සාමාන්‍ය පුහුණුව / විශේෂ ගුරු පුහුණුව / විද්‍යාපීඨ පුහුණුව හෝ උපාධි සහතිකය ලබා තිබීම හා විධිමත් හා ස්ථිර පත්වීමක් ලබා තිබීම.

සහ

2. පාසලක සේවය කරන්නේ නම් අ.පො.ස. (උ.පෙළ) ශ්‍රේණිවල දැනට සාමාන්‍ය තොරතුරු තාක්ෂණය **(GIT)** විෂයය ඉගැන්වීමේ නිරත වීම හෝ අ.පො.ස. (උ.පෙළ) / අ.පො.ස. (සා.පෙළ) ශ්‍රේණිවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය **(ICT)** විෂයය ඉගැන්වීමේ නිරත වීම.

හෝ

අ.පො.ස. (උ.පෙළ) / අ.පො.ස. (සා.පෙළ) එම විෂයයන්ට අදාළව ගුරු උපදේශකවරයෙකු **(ISA)** ලෙස කටයුතු කිරීම.

හෝ

පරිගණක සම්පත් මධ්‍යස්ථානයන් හි අදාළ විෂය ඉගැන්වීමේ නිරතවන උපදේශකවරයෙකු වීම.

1.2 අංක 10 සම්පූර්ණ කිරීමේ දී ඉල්ලුම්කරන ලද විෂයට අදාළ සුදුසුකම් ඇතුළත් කිරීම අනිවාර්ය වේ. එසේ සඳහන් කිරීමට අපොහොසත් වන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1.3 අංක 13 සහ 14 ජේද සම්පූර්ණ කිරීමේ දී "ඔව්" (Yes) හෝ "නැත"(No) යන්න අදාළ කොටුව තුළ පැහැදිලිව සටහන් කරන්න. එසේ සම්පූර්ණ නොකරන ලද ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- ▪ දැනට ඔබට විරුද්ධව විනයානුකූල පරීක්ෂණයක් පැවැත්වේ නම් හෝ ඔබ විභාග තහනමකට ලක්වූ අයකු නම් හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ නොහැකි ය.
- ▪ පවුලේ සාමාජිකයා යන්නෙන් අදහස් කරන්නේ ඔබගේ දරුවන් හා දරුවන්ගේ දරුවන් ද ඔබගේ හෝ කලත්‍රයාගේ හෝ සොයුරු සොයුරියන් හා ඔවුන්ගේ දරුවන් සහ එම දරුවන්ගේ දරුවන්වේ.

1.4 පූර්වෝක්ත විභාගයේ උත්තරපත්‍ර ඇගයීම් මධ්‍යස්ථාන මෙහි පහත දක්වා ඇති නගරවල පිහිටුවීමට යෝජිත ය. ඇගයීම් මධ්‍යස්ථාන පිහිටුවීමට යෝජිත නගර අංක හා නගර

| | | | |
|---|---|---|---|
| **01.** කොළඹ | **17.** ඇඹිලිපිටිය | **32.** කුලියාපිටිය | **48.** කල්මුණේ |
| **03.** හෝමාගම | **19.** බණ්ඩාරවෙල | **33.** හලාවත | **49.** අක්කරෙයිපත්තුව |
| **08.** හොරණ | **20.** බදුල්ල | **35.** අනුරාධපුරය | **50.** මඩකලපුව |
| **10.** කළුතර | **23.** අම්බලන්ගොඩ | **37.** ත්‍රිකුණාමලය | **51.** වවුනියාව |
| **12.** මීගමුව | **25.** ගාල්ල | **38.** කෑගල්ල | **53.** යාපනය |
| **13.** ගම්පහ | **27.** මාතර | **41.** මහනුවර | **57.** දඹුල්ල |
| **14.** නිට්ටඹුව | **28.** තංගල්ල | **45.** හැටන් | |
| **15.** රත්නපුර | **30.** කුරුණෑගල | **46.** මොනරාගල | |

සැ.යු. ඔබ ඉල්ලුම් කළ යුත්තේ රාජකාරි ලිපිනයට ආසන්නව ම ඇති ඇගයීම් මධ්‍යස්ථානයට ය. ප්‍රමාණවත් ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාවක් නොලැබෙන නගරවල ඇගයීම් මධ්‍යස්ථාන පිහිටුවනු නොලැබේ. එබැවින් දෙවන කැමැත්ත ද ඉල්ලුම්පත්‍රයේ සඳහන් කළ යුතු ය.

1.5 ඉල්ලුම්පත්‍රයේ සියළුම කොටස් සම්පූර්ණ කර **Submit button click** කිරීමෙන් පසු ඔබගේ ඉල්ලුම්පත්‍රය **PDF** ආකාරයට බාගත කරගත හැකි වේ. එම ඉල්ලුම්පත්‍රයෙහි දෘඪ පිටපතක් ඔබ විසින් ලබාගත යුතු ය.

1.6 එම දෘඪ පිටපතේ **11 (a)** කොටස (කාලසටහන) අත් අකුරින් සම්පූර්ණ කර විදුහල්පති/ නියෝජ්‍ය විදුහල්පති/ සහකාර විදුහල්පති මඟින් සහතික කරවාගත යුතු ය.

1.7 ඉල්ලුම්පත්‍ර යොමුකළ හැක්කේ මාර්ගගත ක්‍රමයට පමණි. රජයේ පාසල් ගුරුවරුන්ගේ ඉල්ලුම්පත්‍ර මාර්ගගත ක්‍රමයට විදුහල්පති විසින් නිර්දේශ කර මෙම දෙපාර්තමේන්තුවට එවිය යුතු ය.

1.8 පසුගිය සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගයේ ඇගයීම් කටයුතු සිදුකළ පරීක්ෂකවරුන් හැර අනෙකුත් සියලුම ඉල්ලුම්කරුවන් මේ සඳහා සුදුසුකම් සපුරා ඇති බව සනාථ කිරීමට ඉල්ලුම්පත සමඟ අදාළ අධ්‍යාපන සහතිකවල (විෂයන් සහිතව) සහතික කරන ලද ඡායා පිටපත් අමුණා එවිය යුතු ය.

02. අයදුම්පත සහතික කිරීම,

ගුරුවරයකු නම් විදුහල්පති විසින් ද ගුරු උපදේශකවරයකු නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද වෙනත් ආයතනයක සේවය කරන්නකු නම් එම ආයතන ප්‍රධානියා විසින් ද මෙය සහතික කළ යුතු ය.

03. අයදුම්පත සහතික කිරීම සඳහා උපදෙස් (විදුහල්පති / ආයතන ප්‍රධානියා)

3.1 අයදුම්කරු මෙම ආකෘතියේ සඳහන් කරන ලද තොරතුරු නිවැරදිදැයි ඔබ විසින් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.

3.2 අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු නිවැරදි බව 3 වන පිටුවේ අදාළ ස්ථානයෙහි අනිවාර්යයෙන් ම සහතික කළ යුතුය.

3.3 අයදුම්පත්‍රයේ අංක 16 (a) (i) සිට (iv) දක්වා ඇති කරුණු යටතේ අයදුම්කරු පිළිබඳ ව ඔබේ තක්සේරුව අදාළ කොටුව තුළ නියමිත අක්ෂරය සටහන් කිරීමෙන් දැක්විය යුතුය.

A - විශිෂ්ටයි B - හොඳයි C - සාමාන්‍යයි W - දුර්වලයි

3.4 මෙය රහස්‍ය වාර්තාවකි. සියලුම අයදුම්පත් ඔබ විසින් මාර්ගගත ක්‍රමයට දෙපාර්තමේන්තුව වෙත යොමුකළ යුතුය.

01. එසේම බාගත කර සම්පූර්ණ කරන ලද සියලුම ඉල්ලුම්පත්‍ර සහතික කිරීමෙන් පසු එක් පිටපතක් උපලේඛනගත කර (නවක අයදුම්කරුවන්ගේ නම් අදාළ ඇමුණුම් ද සහිතව) ඔබ කාර්යාලයේ සුරක්ෂිතව තබාගත යුතුය.

02. සාරාංශ වාර්තාවේ මුල් පිටපත හා සියලුම අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍රවල මුල් දෘඪ පිටපත් හා සහතික කරන ලද ඇමුණුම් සියල්ල පහත ලිපිනයට යොමු කරන්න. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "GIT – 2025 උත්තරපත්‍ර පරීක්ෂක ඉල්ලුම්පත්‍ර" ලෙස සඳහන් කළ යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්
පාසල් විභාග ඇගයීම් ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503, කොළඹ.

සියලුම අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසන් දිනය 2025.10.31 බව සලකන්න.